(නවවැනි පාර්ලිමේන්තුව - පස්වැනි සභාවාරය)

**අංක 1(4).]**

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2024 මාර්තු 22 සිකුරාදා**

---

**2024 අප්‍රේල් 01 සඳුදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

අන්තර්ජාතික ථේරවාද ධර්මායතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

---

**2024 අප්‍රේල් 02 අඟහරුවාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා,— සිවිල් ගුවන්සේවා පනත යටතේ රෙගුලාසි,— 2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනතේ 117(2)(ඍ) වගන්තිය යටතේ කොළඹ ගුවන් ගමන් තොරතුරු කලාපය හරහා පියාසර කරන ගුවන්යානා වෙත ශ්‍රී ලංකාව විසින් සපයනු ලබන ගගන නාවික පහසුකම් සහ සේවාවන් භාවිතා කිරීම සඳහා ගෙවිය යුතු ගාස්තු සම්බන්ධයෙන් වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 දෙසැම්බර් 12 දිනැති අංක 2362/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.03.22 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

කර්මාන්ත අමාත්‍යතුමා සහ සෞඛ්‍ය අමාත්‍යතුමා,— ආයුර්වේද පනත යටතේ නියෝග,— 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 7(උ), 10 සහ 77 වගන්ති සහ VI කොටස සමඟ කියවිය යුතු 82 වගන්තිය යටතේ ආයුර්වේද සංග්‍රහය සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් 2024 ජනවාරි 24 දින සාදන ලදුව, 2024.03.19 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

**2024 අප්‍රේල් 24 බදාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

588/2024

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ වනවිට එම ආයතනවල සේවය කරනු ලබන මුළු සේවකයන් සංඛ්‍යාව කොපමණද ;

(iii) එම සේවකයන් නඩත්තු කිරීම සඳහා රජය විසින් වාර්ෂිකව වැය කරනු ලබන මුළු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට ඉහත සඳහන් සියලුම පළාත් පාලන ආයතනවල පවතින නගරාධිපති, සභාපති හා මන්ත්‍රී තනතුරු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකුට ගෙවනු ලබන මුළු මාසික දීමනාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) පළාත්පාලන ආයතනවල සියලු මන්ත්‍රීවරුන් සඳහා රජය විසින් දරනු ලබන මුළු වියදම මාසිකව හා වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සහ කෘෂි පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් ඇතුළු රජයේ ක්ෂේත්‍ර නිලධාරීන්ට තමා සේවය කරනු ලබන කොට්ඨාසය නියෝජනය කරමින් පළාත් පාලන ඡන්දයට ඉදිරිපත් වීමට තිබූ අවස්ථාව අහිමි කරමින් සිදු කරන ලද සංශෝධනය ඉවත් කිරීමට කඩිනමින් කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

610/2024

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා,— අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහයට අනුව පැනවිය හැකි උපරිම දඬුවම මරණ දඬුවම බවත්;

(ii) මරණ දඬුවම ක්‍රියාත්මක කිරීම මේ වනවිට සිදු නොවන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මරණ දඬුවම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ලණු ඇතුළු අනෙකුත් ද්‍රව්‍ය සම්පාදනය කර එල්ලුම් ගහ අලුත්වැඩියා කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා වැය කර ඇති මුදල කොපමණද;

(iii) අලුගෝසු තනතුර සඳහා බඳවාගැනීමට පියවර ගෙන තිබේද;

(iv) මරණ දඬුවම ක්‍රියාත්මක කිරීමට එරෙහිව බාධාවන් තිබේද;

(v) එසේ නම්, එම බාධාවන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

611/2024

ගරු ජයන්ත සමරවීර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වත්මන් ජනාධිපතිතුමා, ජනාධිපති ධුරයට පත්වීමෙන් පසු සහභාගී වී ඇති විදේශීය සංචාර කවරේද;

(ii) එම එක් එක් විදේශීය සංචාරයේදී හමු වූ විදේශීය රාජ්‍ය නායකයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම විදේශීය රාජ්‍ය නායකයන් සමඟ රාජ්‍ය තාන්ත්‍රික ගිවිසුම්වලට එළඹුණේද;

(iv) එසේ නම්, ගිවිසුම්වලට එළැඹි කාරණය එක් එක් ගිවිසුම අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) ඉහත සඳහන් එක් එක් විදේශීය සංචාරයේදී ජනාධිපතිතුමා සමඟ සහභාගි වූ සෙසු නියෝජිත පිරිස වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) එම එක් එක් විදේශීය සංචාරය සඳහා රජය විසින් වියදම් කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

636/2024

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා,— කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2023 වර්ෂයේදී රජයේ මැදිහත්වීම මත විදේශ රැකියා සඳහා ශ්‍රී ලාංකික සේවකයන් යොමු කර ඇති රටවල් කවරේද;

(ii) එම එක් එක් රට වෙත යොමු කර ඇති සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2023 වර්ෂයේදී රජයේ මැදිහත්වීමකින් තොරව විදේශ රැකියා සඳහා යොමු වී ඇති ශ්‍රී ලාංකික සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම වර්ෂයේදී විදේශීය රැකියාවල නියුතු සේවකයන් විසින් ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කර ඇති මුළු විදේශ විනිමය ප්‍රමාණය කොපමණද;

(v) ඉදිරියේදී විදේශීය රැකියා සඳහා ශ්‍රී ලාංකික පුහුණු ශ්‍රමිකයන් යොමු කරවීමට සකස් කර ඇති වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1090/2024

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇති කල්බදු සමාගම් සංඛ්‍යාව කොපමණද;

(ii) විධිමත් පරිදි ලියාපදිංචි කර නොමැති කල්බදු සමාගම් සම්බන්ධයෙන් නීතිමය පියවර ගෙන තිබේද;

(iii) කල්බදු සමාගම් විසින් විවිධ පොලී අනුපාත අය කිරීම හේතුවෙන් එම සමාගම් සමඟ ගිවිසුම්ගත වී ඇති පාර්ශ්වයන් දැඩි අපහසුතාවකට පත් වී ඇති බව දන්නේද;

(iv) එම සමාගම් විසින් අය කරනු ලබන පොලී අනුපාතයන් නියාමනය කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙළක් මේ වන විට ක්‍රියාත්මක කර තිබේද;

(v) කල්බදු පහසුකම් ලබා ගන්නා ලද ගනුදෙනුකරුවන් ආරක්ෂා කර ගැනීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1126/2024

ගරු ඩී. වීරසිංහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයෙන් පසු ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවයට බඳවාගන්නා ලද පුද්ගලයන්ට හිමි වන විශ්‍රාම වැටුප, දායක විශ්‍රාම වැටුපක් බව දන්නේද;

(ii) රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ මත හිමි විශ්‍රාම වැටුප සම්බන්ධයෙන් තීරණය කරන බව පත්වීම් ලිපියේ සඳහන් කර තිබේද;

(iii) එසේ නම්, ඉදිරියේදී මෙම රාජ්‍ය සේවකයන්ට විශ්‍රාම වැටුප් හිමිකම ලබා දීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1147/2024

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය,— වාරිමාර්ග අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර, උඩවලව ජලාශය පසුගිය කාලයේ පැවති නියඟය හේතුවෙන් සිඳී ගිය බවත්;

(ii) ඒ හේතුවෙන් ප්‍රදේශයේ ගොවි ජනතාව හා වන සතුන් ජලය නොමැති වීමෙන් දැඩි පීඩාවකට පත් වූ බවත්;

(iii) රොන්මඩ හේතුවෙන් එම ජලාශය විශාල ලෙස ගොඩ වී ඇති බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) (i) උඩවලව ජලාශයේ පවතින රොන්මඩ ඉවත් කිරීම සඳහා පියවර ගන්නේද;

(ii) ඒ සඳහා වෙන් කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

(iii) රොන්මඩ ඉවත් කිරීමේ කටයුතු ආරම්භ කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1152/2024

ගරු නීතිඥ මධුර විතානගේ මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) උමා ඔය ව්‍යාපෘතියේ වැඩකටයුතු අවසන් කර තිබේද;

(ii) ඒ සඳහා වැය කර ඇති මුදල කොපමණද;

(iii) එම ව්‍යාපෘතිය විවෘත කරනු ලබන දිනය කවරේද;

(iv) එම ව්‍යාපෘතිය මඟින් ආවරණය කරනු ලබන ප්‍රදේශ කවරේද;

(v) ඉහත ව්‍යාපෘතිය තුළින් අස්වද්දනු ලබන කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1248/2024

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා,— කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉහළ යන ජීවන වියදමට සමගාමීව පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වැටුප් වැඩි කිරීමට ගෙන ඇති පියවර;

(ii) තවමත් එවැනි පියවර ගෙන නොමැති නම් ඊට හේතු;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පවතින ආර්ථික අර්බුදවලදී කාන්තා ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ගෙන ඇති විශේෂ ක්‍රියාමාර්ග;

(ii) වත්මන් ආර්ථික අර්බුදයට මුහුණ දීම සඳහා කාන්තාවන් ශ්‍රම බලකායට එක්වීමේ ප්‍රවණතාවක් පවතින බැවින්, කාන්තා ශ්‍රමිකයින්ගේ දරුවන්ට ළමා ආරක්ෂණය, පෝෂණය සහ එවැනි සහාය ලබා දීමට ගෙන ඇති ක්‍රියාමාර්ග;

(iii) විදෙස්ගත ගෘහ සේවිකාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ගෙන ඇති පියවර;

(iv) තවමත් එවැනි පියවරක් ගෙන නොමැති නම් ඊට හේතු;

කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1252/2024

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලෝකයේ බොහෝ රටවල් මේ වනවිට පෞද්ගලික වෛද්‍ය අධ්‍යාපනය ප්‍රවර්ධනය කරනු ලබන බව දන්නේද;

(ii) බටහිර වෛද්‍ය අධ්‍යාපනය ලබා දෙනු ලබන ශ්‍රී ලංකාවේ ඇති පෞද්ගලික වෛද්‍ය අධ්‍යාපන ආයතන සංඛ්‍යාව කොපමණද;

(iii) එම ආයතනවල නම් කවරේද;

(iv) ඉහත සඳහන් පෞද්ගලික වෛද්‍ය අධ්‍යාපන ආයතනවල ඉගෙනුම ලබන සිසුන්ට අවශ්‍ය සායනික පුහුණුව සඳහා පවතින රජයේ ශික්ෂණ රෝහල් සංඛ්‍යාව කොපමණද;

(v) එම රෝහල්වල නම් කවරේද;

(vi) ශ්‍රී ලංකාවේ පෞද්ගලික බටහිර වෛද්‍ය අධ්‍යාපනය දියුණු කිරීමට හා ප්‍රවර්ධනය කිරීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

**2024 අප්‍රේල් 25 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1281/2024

ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා,— නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා නාගරික සංවර්ධන අධිකාරිය විසින් මොනරාගල දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ව්‍යාපෘතියේ නම සහ ඒ සඳහා වැය කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ව්‍යාපෘති අතරින් මේ වනවිට වැඩ අවසන් කර ඇති ව්‍යාපෘති සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(iv) මේ වනවිට වැඩ අවසන් කර නොමැති ව්‍යාපෘති සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(v) එම ව්‍යාපෘතිවල වැඩ අවසන් නොකිරීමට හේතු කවරේද;

(vi) ඒවායේ වැඩ කඩිනමින් අවසන් කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1283/2024

ගරු අසංක නවරත්න මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ රජයේ රෝහල්වල මේ වනවිට පවතින මානව සම්පත් හා භෞතික සම්පත් ඌනතාවයන් සම්බන්ධයෙන් සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(ii) එම ඌනතා සපුරාලීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1286/2024

ගරු කිංස් නෙල්සන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආයතනවල නම් කවරේද;

(iii) වර්ෂ 2018 සිට මේ දක්වා එම එක් එක් පළාත් පාලන ආයතනයේ වාර්ෂික ආදායම හා වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන අතරින් මූල්‍ය හා භෞතික සම්පත් හිඟ පළාත් පාලන ආයතන නගා සිටුවීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1700/2024

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හදිසි මිලදී ගැනීමේ යෝජනා ක්‍රමය අනුව අංක 2022/MSD/V/R/P/0066 ටෙන්ඩර්ය යටතේ මිලදී ගැනීම සඳහා අනුමත වූ ඖෂධ වර්ග තිස් දෙක (32) කවරේද;

(ii) එම ඖෂධ අතරින් සපයන ලද ඖෂධ වර්ග කවරේද;

(iii) එම ඖෂධ ලියාපදිංචි කර තිබේද;

(iv) ඉහත ටෙන්ඩරය ප්‍රදානය කිරීමේදී සම්මත ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කර තිබේද;

(v) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ඖෂධ භාවිතා කිරීමෙන් අහිතකර ප්‍රතිවිපාක වාර්තා වී තිබේද;

(ii) එම ඖෂධ සඳහා වැඩ ඇණවුම් ඉල්ලීම ලබා දුන්නේ කවුරුන්ද;

(iii) සෙල්සියස් අංශක 2 - 8 අතර උෂ්ණත්වයක් යටතේ ලබා දිය යුතු සමහර ඖෂධ ඉහත ඇණවුම තුළ අන්තර්ගත වී තිබියදී, වෛද්‍ය සැපයුම් අංශය විසින් එම ඇණවුම සඳහා අනුමතිය ලබා දීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1702/2024

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකා පොලීසියේ, පොලිස් පරීක්ෂක, පොලිස් සැරයන් සහ පොලිස් කොස්තාපල් යන එක් එක් තනතුරේ සේවය කරනු ලබන නිලධාරින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත සඳහන් එක් එක් තනතුරේ මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත තනතුරුවල සේවය කරනු ලබන නිලධාරින්ට උසස්වීම් ලබාදීමේදී අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(iv) පොලිස් සැරයන් තනතුරේ සිට පොලිස් පරීක්ෂක තනතුරට උසස් වීම සඳහා ගත වන කාලය කොපමණද;

(v) ශ්‍රී ලංකා පොලීසියට ආධුනික පොලිස් කොස්තාපල්වරුන් බඳවාගැනීමේදී, මේ වනවිට අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1727/2024

ගරු ජගත් ප්‍රියංකර මහතා,— වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 සිට මේ දක්වා පුත්තලම දිස්ත්‍රික්කයේ අලි-මිනිස් ගැටුම හේතුවෙන් මිය ගිය පුද්ගලයන් සංඛ්‍යාව සහ වන අලින් සංඛ්‍යාව එක් එක් වනජීවී කලාපය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) පුත්තලම දිස්ත්‍රික්කයේ පවතින අලි-මිනිස් ගැටුමට ස්ථිර විසඳුමක් ලබා දීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1737/2024

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඇති රජයේ වී ගබඩා සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා පිහිටුවා ඇති ස්ථාන කවරේද;

(iii) ඉහත එක් එක් ගබඩාවේ ගබඩා කළ හැකි වී ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) වර්ෂ 2015 සිට මේ දක්වා ඉහත ගබඩාවල ගබඩා කරන ලද වී ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(i) හි සඳහන් වී ගබඩා අතරින් මේ වනවිට භාවිතයට නොගන්නා වී ගබඩා තිබේද;

(ii) එසේ නම්, එම වී ගබඩා සංඛ්‍යාව කොපමණද;

(iii) ඒවා පිහිටා ඇති ස්ථාන කවරේද;

(iv) භාවිතයට නොගන්නා වී ගබඩා නැවත භාවිතයට ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(v) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඇති වී ගබඩාවලින් උපරිම ප්‍රයෝජනය ලබා ගැනීම සඳහා ක්‍රියාත්මක කිරීමට නියමිත වැඩසටහන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1749/2024

ගරු ඉෂාක් රහුමාන් මහතා,— නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වකුගඩු රෝගීන් සිටින පවුල්වල නිවාස අලුත්වැඩියා කිරීම සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් මූල්‍යමය ආධාරයක් ලබා දෙන්නේද;

(ii) එම මූල්‍යමය ආධාරය කොපමණද;

(iii) එම ආධාරය ලබා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් කවරේද;

(iv) ආධාරය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත මූල්‍යමය ආධාරය ලබා ගැනීම සඳහා ඉල්ලුම් කර ඇති පුද්ගලයන් සංඛ්‍යාව සහ මේ වනවිට එම අධාරය ලබා දී ඇති පුද්ගලයන් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) සුදුසුකම් සපුරා ඇති සියලුම ඉල්ලුම්කරුවන්ට එම ආධාරය ලබා දෙන්නේද;

(iii) එසේ නම් එම දිනය කවරේද;

(iv) ස්ථිර නිවසක් නොමැති වකුගඩු රෝගීන් සිටින පවුල් සඳහා නිවසක් ඉදිකර දීමේ වැඩසටහනක් ආරම්භ කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1873/2024

ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා,— අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2020 ජූලි 01 දින සිට 2020 දෙසැම්බර් 31 දින දක්වා මඩකලපුවේ මහාධිකරණ නඩු කටයුතු වලට පත්කරන ලද සහ මාරුවීම් ලබාදෙන ලද විනිශ්චයකාරවරුන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉහත මාරුවීම් විනිශ්චයකාරවරුන්ට මාරුවීම් ලබාදෙන සාමාන්‍ය ක්‍රමයට සිදු කරන ලදේද් ද;

(iii) නො එසේ නම්, ඉහත මාරුවීම් වලට හේතු කවරේ ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහි ද?

(ආ) නො එසේ නම් ඒ මන්ද?

1876/2024

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට පාසල් අධ්‍යාපනය ලබන සිසුවියන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ සනීපාරක්ෂක තත්ත්වය උසස් කිරීමේ අරමුණින් ඔවුන්ට සනීපාරක්ෂක තුවා ලබා දීමේ වැඩසටහනක් අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කර තිබේද;

(iii) එසේ නම්, එම වැඩසටහන සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

(iv) සියලු පාසල් සිසුවියන් අවරණය වන පරිදි එම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2024 අප්‍රේල් 26 සිකුරාදා
# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2/2024

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර ජාතික රෝහලට අයත් ඉඩම් අනවසර පදිංචිකරුවන් විසින් අත්පත් කර ගෙන ඇති බවත්;

(ii) ඒ හේතුවෙන් එම රෝහලට අයිති ඉඩම්වලින් අඩකට වඩා අහිමි වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ අත්පත් කර ගෙන ඇති ඉඩම් අක්කර ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම්වල අනවසරයෙන් පදිංචි වී සිටින පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) එම පවුල් සම්බන්ධයෙන් මේ වනවිට නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(iv) අනවසර පදිංචිකරුවන් වෙනත් ප්‍රදේශයක පදිංචි කිරීම සඳහා මේ වනවිට සැලසුම් කර තිබේද;

(v) එසේ නම්, එම සැලැස්ම කවරේද;

(vi) අදාළ ආයතන සහ බලධාරීන් විසින් ඊට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

42/2024

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කඹුරුපිටිය, මිරිස්වත්ත වලව්වේ පදිංචිව සිටි සාරා ලෝරෙන්සිනා විජේසිංහ මැතිනිය විසින් තම දෙමාපියන් සිහිවීම පිණිස මාතර, රාහුල විද්‍යාලයට පරිත්‍යාග කරන ලද ගුණතිලක ස්මරණ ශාලාව කඩා ඉවත් කරන ලද බව දන්නේද;

(ii) එසේ නම්, එම ශාලාව කඩා ඉවත් කිරීමට හේතු කවරේද;

(iii) එය කඩා ඉවත් කරන ලද දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ගුණතිලක ස්මරණ ශාලාව වෙනුවට ඉදිකරනු ලබන නව ස්මරණ ශාලාව සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(ii) එම මුදල ලබා ගැනීමට අපේක්ෂිත මූලාශ්‍ර කවරේද;

(iii) නව ස්මරණ ශාලාව ඉදිකිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් වැය කරනු ලබන මුදල කොපමණද;

(iv) ඒ සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් මුදල් ලබා දී තිබේද;

(v) එසේ නම්, එම මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) නව ස්මරණ ශාලාවේ ඉදිකිරීම්වලින් මේ වනවිට නිම කර ඇති ප්‍රමාණය කොපමණද;

(ii) ඉතිරි කොටස නිම කිරීමට අපේක්ෂිත දිනය කවරේද;

(iii) එම ඉදිකිරීම් ප්‍රමාද වීමට හේතු කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1908/2024

ගරු තිස්ස අත්තනායක මහතා,— කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් කෙටුම්පත් කරන ලද අස්වැසුම සුභසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ වර්ෂ 2024 සිට 2026 දක්වා වූ කාල පරිච්ඡේදය තුළ දිළිඳු හා අන්ත දිළිඳු පවුල් ලක්ෂ 12ක් සවිබල ගැන්වීමේ වැඩසටහන සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී තිබේද;

(ii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(iii) එම වැඩසටහන ආරම්භ කිරීමට අපේක්ෂිත කාලවකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1911/2024

ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2022 දක්වා එක් එක් වර්ෂයේ ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද පොල්තෙල් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iii) පොල්තෙල් ආනයනය කරන ලද රටවල් සහ සමාගම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1916/2024

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවට ආවේණික ඖෂධ පැළෑටි වර්ග කවරේද;

(ii) ශ්‍රී ලංකාව ඖෂධ පැළෑටි අපනයනය කරන්නේද;

(iii) එසේ නම්, එම ඖෂධ පැළෑටි වර්ග කවරේද;

(iv) ඒවා අපනයනය කිරීමෙන් වාර්ෂිකව උපයනු ලබන ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1939/2024

ගරු මිලාන් ජයතිලක මහතා,— වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් අතරින් ඉදිකිරීම් හා සංවර්ධන කටයුතු සඳහා මේ වනවිට භාවිතා කරනු ලබන ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම ඉඩම් පෞද්ගලික අංශයට බදු පදනම මත ලබා දී තිබේද;

(iv) එසේ නම්, එම සමාගම්/ආයතන කවරේද;

(v) ඉඩම් බදු දීම මගින් අධිකාරිය උපයන වාර්ෂික ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1967/2024

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2019 සිට මේ දක්වා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් සිදු කර ඇති වැටලීම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම වැටලීම් සංඛ්‍යාව අතරින් මේ වනවිට නීතිමය පියවර ගෙන ඇති වැටලීම් සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත වැටලීම් සංඛ්‍යාව අතරින් සමථයකට පත් කරගෙන ඇති වැටලීම් සංඛ්‍යාව කොපමණද;

(iv) පාරිභෝගිකයන්ගේ සුරක්ෂිතභාවය තහවුරු කිරීම උදෙසා අධිකාරියේ මෙහෙයුම් අඛණ්ඩව සිදු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එකම භාණ්ඩය විවිධ මිල ගණන් යටතේ අලෙවි කිරීම සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1993/2024

ගරු වාසුදේව නානායක්කාර මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2023.07.01 දින පොලිස් නිලධාරීන් සමඟ පැමිණි සෙවනගල සීනි කර්මාන්ත ශාලාවේ පාලන අධිකාරිය විසින් ඕංඩුම නිවාස සංකීර්ණයේ නිවාසවල ජලය හා විදුලිය විසන්ධි කර ඇති බවත්;

(ii) විශ්‍රාම ගන්වන අවස්ථාවේදී යැපෙන්නන් බඳවාගැනීමට හෝ පදිංචිය සඳහා ඉඩමක් ලබා දීමට, 1983-1986 කාලයේදී එම නිවාස සංකීර්ණයේ නිවාසවල සේවකයන්ව පදිංචි කරවන අවස්ථාවේදී පාලන අධිකාරිය විසින් පොරොන්දු වී ඇති බව ත්;

(iii) වර්ෂ 30-40ක් තිස්සේ එම නිවාසවල පදිංචි වී සිටිමින් ආයතනයේ අභිවෘද්ධිය වෙනුවෙන් එම සේවකයන් ක්‍රියා කර ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) පදිංචිව සිටින සේවකයන්ට අසාධාරණ ලෙස සලකමින් ආයතනයේ ඉඩම් කැබලි පදිංචි වීම සඳහා වෙනත් බාහිර පුද්ගලයන්ට ලබා දෙන බව දන්නේද;

(ii) ඉහත නිවාසවල පදිංචි වී සිටින සේවකයන්ට තවදුරටත් එම නිවාසවල රැඳී සිටීමට අවසර දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2006/2024

ගරු මයන්ත දිසානායක මහතා,— මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය දරන, අර්ධ රාජ්‍ය සහ පෞද්ගලික අංශ සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ වනවිට එම අරමුදලේ ඇති මුදල කොපමණද;

(iii) එම මුදල් වෙනත් වැඩසටහන් සඳහා භාවිතා කරන්නේද;

(iv) එසේ නම්, එම වැඩසටහන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2021/2024

ගරු ශානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නැගෙනහිර පළාතේ, සමන්තුරේ, කල්මුණේ, පොතුවිල්, එරාවූර් සහ මරුදමුණේ යන ස්ථානවල 2014.02.05 දින සිට Privelth Global (Pvt.) Ltd. යන නමින් මූල්‍ය ආයතනයක් පවත්වාගෙන යන ලද බවත්;

(ii) එම ආයතනයේ අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කරන ලද අහමඩ් ෂෙරීම් මුහම්මදු සිහාෆ් (සිහාෆ් ෂෙරීම්) සහ ෆාතිමා ෆර්සානා මාර්කාර් යන අය විසින් පුද්ගලයන් 1400 දෙනෙකුගේ රුපියල් කෝටි 170 කට අධික මුදලක් වංචා කර ඇති බවත්;

(iii) ඉහත සඳහන් අධ්‍යක්ෂවරයා සහ ඔහුගේ පවුලේ අය මේ වනවිට ඉන්දියාවේ සැඟවී සිටින බවත්;

(iv) මේ සම්බන්ධයෙන් කල්මුණේ සහ සමන්තුරේ පොලිස් ස්ථාන වෙත පැමිණිලි කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත පුද්ගලයන් අත්අඩංගුවට ගෙන ශ්‍රී ලංකාවට රැගෙන ඒමට ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

# දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

පා. 28/2024

ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා,— ශීඝ්‍රයෙන් ඉහළ යන මාර්ග අනතුරු පිළිබඳ කරුණු විමර්ශනය කර මාර්ග අනතුරු අවම කරගැනීම සඳහා අවශ්‍ය නීති ප්‍රතිසංස්කරණ සහ අනෙකුත් ප්‍රායෝගික ක්‍රියාදාමයන් සඳහා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,— වර්තමානයේ මාර්ග ආශ්‍රිතව සිදුවන රථවාහන අනතුරු හේතුවෙන් මිනිස් ජීවිත අකාලයේ අහිමිවීමත්, පූර්ණ හෝ අර්ධකාලීන ආබාධිත තත්ත්වයන්ට පත්වීමත් බහුලව සිදු වන හෙයින්ද;

මිනිස් ජීවිත අහිමි වීම සහ ආබාධිත තත්ත්වයට පත්වීම තුළ පවුල් සංස්ථාව තුළ ආර්ථික හා වෙනත් ගැටලු ඇතිවන අතර දරුවන්ගේ අධ්‍යාපනය මෙන්ම අනෙකුත් කටයුතු අඩාල වීම විශේෂ අවධානයට ලක් කළ යුතු වන හෙයින්ද;

වර්තමාන ආර්ථික තත්ත්වය තුළ සෞඛ්‍ය ක්ෂේත්‍රයට ද මෙය විශාල වැය බරක් වන අතර රථවාහන අනතුරු මගින් දේපළවලට, රථ වාහනවලට මෙන්ම මාර්ගවලට සිදුවන අලාභ හානි හේතුවෙන් ඒවා ප්‍රතිසංස්කරණය කිරීම සඳහා සැලකිය යුතු පිරිවැයක් දැරිය යුතු වන හෙයින්ද;

පොලිස් වාර්තා අනුව 2023.01.01 සිට 2023.12.31 දක්වා කාල සීමාව තුළ සිදු වූ මාරක රථවාහන අනතුරු 2200ක් හේතුවෙන් මිනිස් ජීවිත 2310ක් අහිමි වී ඇති අතර වැඩි වශයෙන් පදිකයින් හා යතුරුපැදිකරුවන් ඇතුළුව පසුපැදිකරුවන්, රියැදුරන්, මගීන් හා මාර්ගය පරිහරණය කරන්නන් 2293ක් ද, මාර්ගය පරිහරණය නොකළ පුද්ගලයින් 17ක් ද මරණයට පත් වී ඇති හෙයින්ද;

බරපතල රිය අනතුරු 6195ක්, සුළු තුවාල රිය අනතුරු 9725ක් සහ අලාභ රිය අනතුරු 6514ක් වශයෙන් වර්ෂය තුළ මුළු රථවාහන අනතුරු 24,634ක් වාර්තා වී ඇති හෙයින්ද;

ශ්‍රී ලංකාව තුළ මෙලෙස අසාමාන්‍ය ලෙස රථවාහන අනතුරු ඉහළ යාම වහාම වළක්වා ගත යුතු ජාතික වගකීමක් ලෙස සැලකිය යුතු වන හෙයින් ද; සහ

ඒ සඳහා රියදුරන්ගේ නොසැලකිල්ල, අනාරක්ෂිත රිය ධාවනය මෙන්ම නීති රාමුවෙහි පවතින දුර්වලතාවයන් හේතු වී ඇති හෙයින්;

(අ) මාර්ග අනතුරු සිදුවීමට හේතු වී ඇති කාරණා හඳුනාගැනීම සඳහා ද;

(ආ) මාර්ග අනතුරු අවම කර ගැනීම සඳහා අවශ්‍ය නීති රාමුවෙහි පවතින අඩුපාඩු හඳුනාගෙන ඒවා යාවත්කාලීන කිරීම පිණිස අවශ්‍ය ප්‍රතිසංස්කරණ කවරේද යන්න හඳුනාගැනීම සඳහා ද; සහ

(ඇ) එසේ මාර්ග අනතුරු ප්‍රමාණය ඉහළ යාම සඳහා බලපා තිබෙන වෙනත් ආනුෂංගික කරුණු කවරේද යන්න හඳුනාගැනීම සඳහා

ශීඝ්‍රයෙන් ඉහළ යන මාර්ග අනතුරු පිළිබඳ කරුණු විමර්ශනය කර මාර්ග අනතුරු අවම කරගැනීම සඳහා අවශ්‍ය නීති ප්‍රතිසංස්කරණ සහ අනෙකුත් ප්‍රායෝගික ක්‍රියාදාමයන් සඳහා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

2. (අ) කථානායකවරයා විසින් කාරක සභාවේ සභාපතිවරයා සහ සාමාජික මන්ත්‍රීවරයන් පත් කළ යුතුය; සහ

(ආ) ස්ථාවර නියෝග 101 හි විධිවිධාන ප්‍රකාරව කාරක සභාව සාමාජික මන්ත්‍රීවරයන් එකළොස් දෙනෙකුගෙන් (11) සමන්විත විය යුතුය.

3. එම කාරක සභාවට —

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) ඉහත සඳහන් කරුණු සම්බන්ධයෙන් පුළුල් අධ්‍යයනයක් සිදු කිරීම සඳහා කාරක සභාව විසින් අවශ්‍ය යැයි තීරණය කරනු ලබන පරිදි, ඕනෑම තැනැත්තෙකු එම කාරක සභාව ඉදිරියට කැඳවීමට ද, ඕනෑම ලියවිල්ලක් හෝ වාර්තාවක් ලබා දෙන ලෙසට ඕනෑම තැනැත්තෙකුට නියම කිරීමට ද, එකී සියලු සාක්ෂි, ලිඛිතව හෝ වාචිකව ලබා ගැනීමට ද;

(ඇ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමට ද; සහ

(ඈ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද පාර්ලිමේන්තුව කල් තබනු ලැබ හෝ වරාවසාන කරනු ලැබ තිබුණ ද රැස්වීම් පවත්වාගෙන යාමට ද

බලය තිබිය යුතුය.

4. කාරක සභාවේ වාර්තාව එහි පළමු රැස්වීමේ දින සිට මාස හතරක (04) කාලයක් හෝ පාර්ලිමේන්තුව විසින් දීර්ඝ කරනු ලබන එවැනි කාල පරිච්ඡේදයක් ඇතුළතදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය.

පා. 29/2024

ගරු නීතිඥ පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය,— කෘෂි භෝග වගාවන්ට, වන සතුන්ගෙන් සිදු වන හානිය පිළිබඳ සොයා බැලීමට සහ එම හානිය වළක්වාලීම සඳහා සුදුසු යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,— ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ආර්ථිකයට මෙන්ම ජාතික ආර්ථිකයට ද මහත් රුකුලක් වන කෘෂි බෝග වගාවන් සඳහා වන සතුන්ගෙන් සිදුවන හානිය හේතුවෙන් ගොවීන් මහත් දුෂ්කරතාවයකට මුහුණපා ඇති හෙයින් ද;

විශේෂයෙන්ම දිවයින පුරා පොල් වගාවේ ඵලදාව අඩකට වඩා අඩුවීමට වන සතුන්ගෙන් සිදුවන හානිය බරපතල ලෙස බලපා ඇති හෙයින් ද;

එමෙන්ම අනෙකුත් බොහෝ වගාවන්ට වන සතුන්ගෙන් සිදුවන හානිය හේතුවෙන් ගොවි ජනතාව ඔවුන්ගේ ආදායම අහිමිවීම මත වගාවන් අත්හැර දැමීමට පවා පෙළඹී ඇති හෙයින් ද;

මෙම තත්ත්වය සඳහා විසඳුම් සෙවිය යුතු රාජ්‍ය ආයතන ඒ සඳහා ප්‍රමාණවත් අවධානයක් යොමු කර ඇති බවක් නිරීක්ෂණය නොවන හෙයින් ද; සහ

විදේශ රටවල මෙවන් තත්ත්වයන් සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ග අධ්‍යයනය කර හෝ ශ්‍රී ලංකාවට උචිත වන අයුරින් එම ක්‍රම අනුගමනය කරමින්, වන සතුන්ගේ පැවැත්ම මෙන්ම ගොවි ජනතාවගේ පැවැත්ම ද තහවුරු කරමින් වඩාත් ඵලදායි ලෙස බෝග වගාවන් ආරක්ෂා කර ගැනීම සඳහා සුදුසු පියවරක් ගත යුතු හෙයින්

කෘෂි භෝග වගාවන්ට, වන සතුන්ගෙන් සිදු වන හානිය පිළිබඳ සොයා බැලීමට සහ එම හානිය වළක්වාලීම සඳහා සුදුසු යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

2. (අ) කථානායකවරයා විසින් කාරක සභාවේ සභාපතිවරයා සහ සාමාජික මන්ත්‍රීවරයන් පත් කළ යුතුය; සහ

(ආ) ස්ථාවර නියෝග 101 හි විධිවිධාන ප්‍රකාරව කාරක සභාව සාමාජික මන්ත්‍රීවරයන් දොළොස් දෙනෙකුගෙන් (12) සමන්විත විය යුතුය.

3. එම කාරක සභාවට—

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) ඉහත සඳහන් කරුණු සම්බන්ධයෙන් පුළුල් අධ්‍යයනයක් සිදු කිරීම සඳහා කාරක සභාව විසින් අවශ්‍ය යැයි තීරණය කරනු ලබන පරිදි, ඕනෑම තැනැත්තෙකු එම කාරක සභාව ඉදිරියට කැඳවීමට ද, ඕනෑම ලියවිල්ලක් හෝ වාර්තාවක් ලබා දෙන ලෙසට ඕනෑම තැනැත්තෙකුට නියම කිරීමට ද, එකී සියලු සාක්ෂි, ලිඛිතව හෝ වාචිකව ලබා ගැනීමට ද;

(ඇ) කාරක සභාවේ සභාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමට ද; සහ

(ඈ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද පාර්ලිමේන්තුව කල් තබනු ලැබ හෝ වරාවසාන කරනු ලැබ තිබුණ ද රැස්වීම් පවත්වාගෙන යාමට ද

බලය තිබිය යුතුය.

4. කාරක සභාවේ වාර්තාව එහි පළමු රැස්වීමේ දින සිට මාස හතරක (04) කාලයක් හෝ පාර්ලිමේන්තුව විසින් දීර්ඝ කරනු ලබන එවැනි කාල පරිච්ඡේදයක් ඇතුළතදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය.